ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2025 - 11 . 10

කේ.එන්.ටී.මධුසංඛ
කිරිමැටියාව,
පිහිඹියගොල්ලෑව,
මැදවච්චිය.

පැමිණිලිකරු

01. උ.පො.ප. එම්.නන්දසේන
පොලිස් ස්ථානය, පිහිඹියගොල්ලෑව

02. පො.ප. එම්.සිසිරසේන
ස්ථානාධිපති (හිටපු)
පොලිස් ස්ථානය, පිහිඹියගොල්ලෑව
(පෞද්ගලික ලිපිනය : යකාවැව,මැදවච්චිය)

වගඋත්තරකරුවන්

**පැමිණිලි අංකය: HRC/ANU/44/2023(S)**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

පැමිණිලිකරු 2023.01.23 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින් ප්‍රකාශ කර සිටින්නේ, ප්‍රදේශයේ ගෙයක් බිඳ එහි තිබූ බඩු සොරා ගැනීමක් සම්බන්ධයෙන් පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානය වෙත ලැබී තිබූ පැමිණිල්ලක් සම්බන්ධයෙන් කටඋත්තරයක් ගැනීම සඳහා තමාව පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානය වෙත 2023.01.11 දින දහවල් 2.30ට පමණ රැගෙන ගිය බවයි. එලෙස රැගෙන ගොස් අදාළ වරද පිළිගන්නා ලෙස බලකර සිටි බවත්, මෙම වරද පිළිනොගත් නිසාවෙන් පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් තම අත් පා බැද බිම දමා අමානුෂික ලෙස පහරදෙන ලද බවත්, එහිදී තමාගේ අතේ අස්ථිවලට හානි සිදුවූ බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

එසේම, අත්අඩංගුවට ගත් දිනට පසුදින එනම්, 2023.01.12 වන දින තමා මැදවච්චිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත්, අධිකරණය මගින් ඇප ලබාදුන් බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. එසේම, තම රෝගී තත්ත්වය උත්සන්න වූ බැවින් තමා එදිනම එනම්, 2023.11.12 වන දිනම මැදවච්චිය රෝහල වෙත ඇතුළත් වූ බවත්, එහිදී තමාව අනුරාධපුර රෝහලට මාරු කර

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

යවන ලද බවත්, එම රෝහලෙහි දින 06ක් නේවාසිකව ප්‍රතිකාර ලබා ගත් බවත් පැමිණිලිකරු විසින් වැඩිදුරටත් සිය පැමිණිල්ල මගින් දක්වා ඇත.

**<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>**

**<u>1 වන වගඋත්තරකාර උ.පො.ප. එම්.නන්දසේන යන අයගේ කරුණු දැක්වීම</u>**

1 වන වගඋත්තරකාර උ.පො.ප. නන්දසේන යන අය විසින් ප්‍රකාශ කර සිටින්නේ, 2023.01.11 වන දින දිවා කාලයේ නිවසක් බිඳ රන් භාණ්ඩ හා මුදල් යනාදිය සොරකම් කිරීම සම්බන්ධයෙන් පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ලැබී තිබූ බවත්, එම පැමිණිල්ල සම්බන්ධයෙන් ස්ථානාධිපතිතුමා විසින් විමර්ශනයක් සිදුකරන ලද බවත්, එකී විමර්ශනය සඳහා උ. පො.ප. නන්දසේන වන තමා, පොලිස් සැරයන් 45709 සේනානායක හා පොලිස් සැරයන් 48481 සෙනෙවිරත්න යන නිලධාරීන් ද සහය වූ බවත්, නිල සුනඛයා සමග පොලිස් සැරයන් 31842 දිසානායක යන අයද සහය වූ බවත් ය.

එසේම, සිදු කරන ලද විමර්ශනයේදී නිල සුනඛයා අපරාධ ස්ථානයේ සිට පැමිණිලිකරුගේ නිවසට ගමන් කළ බවත්, පැමිණිලිකරු එවිට ඔහුගේ නිවසේ පිටුපස සිටි බවත්, නිල සුනඛයා ඔහු සිටි තැනට පැමිණි බවත්, එහිදී නිල සුනඛ අංශයේ නිලධාරීන් විසින් නිල සුනඛ ඉව මත අපරාධයක් සිදුකර ඇත්තේ මොහු වන බවට සනාථ කළ බවත්, ඒ අනුව නිල සුනඛයා විසින් ලබාදුන් ඉව් මත මෙම පැමිණිලිකරුට වරද කියා දී 2023.01.11 වන දින පැය 14.30ට අත්අඩංගුවට ගන්නා ලද බවත් 1 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

**<u>2 වන වගඋත්තරකාර පො.ප. එම්.සිසිරසේන යන අයගේ කරුණු දැක්වීම</u>**

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් 2 වන වගඋත්තරකාර පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති (හිටපු) පො.ප. එම්.සිසිරසේන යන අය විසින් අංක 280/23 සහ 2023.03.07 දිනැති වාර්තාවක් කොමිෂන් සභාව වෙත යොමු කරමින් දන්වා සිටින්නේ, 2023.01.11 වන දින පිහිඹියගොල්ලෑව පොලිස් වසමේ නිවසක් බිඳ රුපියල් 74,000.00ක් වටිනා දේපල සොරකම් කිරීමක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් පොලිස් ස්ථානය වෙත ලැබී තිබූ බවත්, එම පැමිණිල්ල අනුව සිදුකරන ලද වැඩිදුර විමර්ශනයේදී ලද සාක්ෂි අනුව මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇති බවත් ය.

මෙම අපරාධය සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදුකිරීමේදී අපරාධ පරීක්ෂණ නිලධාරීන්, ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර් නිලධාරීන් හා මැදවච්චිය නිල සුනඛ අංශයේ නිලධාරීන් සමඟ නිල සුනඛයා ද යොදා ගත් බවත්, එහිදී නිල සුනඛයා විසින් මෙම පැමිණිලිකරු අසලට ගොස් ඉව ලබාදුන් බවත්, ඒ මත පදනම්ව පැමිණිලිකරුව 2023.01.11 වන දින පැය 14.30ට ඔහුගේ නිවසේදී උප පොලිස් පරීක්ෂක එම්. නන්දසේන නිලධරියා විසින් අත්අඩංගුවට ගන්නා ලද බවත්, එසේම මෙම

පැමිණිලිකරුව 2023.01.12 වන දින මැදවච්චිය ම/උ බි/36/22 යටතේ අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත් 2 වන වගඋත්තරකරු සිය වාර්තාව මගින් දක්වා ඇත.

තවද, මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමෙන් පසුව පැමිණිලිකරු සිය පැමිණිල්ල මගින් දක්වා ඇති පරිදි ඔහුට කිසිදු පහරදීමක් හෝ වෙනත් කායික හෝ මානසික පීඩනයක් සිදුනොකළ බවත් 2 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

**<u>නිරීක්ෂණ</u>**

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කර සිටින්නේ, කිසිදු වරදක් කර නොමැති තමාව අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් එහිදී පහරදී වධහිංසා කිරීමෙන් වගඋත්තරකරුවන් විසින් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කරන ලද බවයි.

වගඋත්තරකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීම සඳහා සාධාරණ තොරතුරු පැවති හෙයින් අත්අඩංගුවට ගෙන ඇති බවත්, අත්අඩංගුවට ගැනීමෙන් පසු ඔහුට කිසිදු පහරදීමක් සිදුකර නොමැති බවත්, ඔහු විසින් කරනු ලබන පහරදීමේ චෝදනාව ප්‍රතික්ෂේප කරන බවත් ය.

වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතෙහි 2023.01.11 දින පැය 09.30ට පිටුව 30 ඡේදය 31 යටතේ යොදා ඇති සටහන අනුව කේ.සමන්ත දිසානායක යන අයගේ නිවස දිවා කාලයේ බිඳ රු. 74,000.00ක් වටිනා දේපල සොරකම් කිරීම සම්බන්ධව පැමිණිල්ලක් පොලිස් ස්ථානය වෙත වාර්තා වී ඇති බව නිරීක්ෂණය වේ.

මෙම පැමිණිල්ල වාර්තා වීමෙන් පසුව ස්ථානාධිපතිගේ නියෝග පරිදි 1 වන වගඋත්තරකාර උ.පො.ප. නන්දසේන හා පො.සැ. 45709 සේනානායක යන පොලිස් නිලධාරීන් දෙදෙනා පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානයේ ග්‍රහන අපරාධ තොරතුරු සටහන් පොතෙහි 2023.01.11 වන දින පැය 10.00ට පිටුව 32 සහ ඡේදය 32හි සටහන් යොදා විමර්ශනයක් සඳහා පිටව ගොස් ඇත. එමෙන්ම, 2 වන වගඋත්තරකාර පො.ප. සිසිරසේන ද 2023.01.11 වන දින පැය 10.15ට පිටුව 33 ඡේදය 33 හි සටහන් යොදා ඉහත පැමිණිල්ලේ විමර්ශන සඳහා පිටව ගොස් ඇත.

පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානයේ ග්‍රහන අපරාධ තොරතුරු සටහන් පොතෙහි 2023.01.11 වන දින පැය 19.15ට පිටුව 33 ඡේදය 34 අනුව 1 වගඋත්තරකාර උ.පො.ප. නන්දසේන යන අය පැමිණිල්ල සම්බන්ධව විමර්ශනය කර සාක්ෂි සහ නිරීක්ෂණ සටහන් යොදා ඇති අතර, ඔහුගේ මෙකී සටහන මගින් පොලිස් ස්ථානය වෙත සොරකමක් සම්බන්ධයෙන් ලද පැමිණිල්ලට අදාළව විමර්ශනයක් සිදුකර ඇති බව නිරීක්ෂණය වේ. මෙම විමර්ශනය සඳහා මැදවච්චිය පොලිස් ස්ථානයේ

නිල සුනඛ 1522 ඩයිසර් නැමැති නිල සුනඛයා යොදා ගෙන ඇති බවත්, මෙම නිල සුනඛයා හට අපරාධ ස්ථානයේ තිබූ ලී මිට සහිත යකඩ මිටියක් ඉව සඳහා ලබාදී ඇති බවත්, ඉව ලබාදීමෙන් පසුව නිල සුනඛයා අදාළ අපරාධ ස්ථානයේ සිට කිලෝ මීටර එකයි කාලක් දුරකින් පිහිටි වීරරත්න (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනු කර ඇති මෙම පැමිණිල්ලේ පැමිණිලිකරුගේ පියා) යන අයගේ නිවසට ගිය බවත් සඳහන් කර ඇත. එම නිවසේ සාලයට ගොස් දොර අභියස සිට ඉව අල්ලමින් එහාට මෙහාට ගමන් කළ බවත්, එම නිවසේ සිට පැමිණි රතු පාට ටී ෂර්ට් එකක් හා රතු පාට දිග බොටම් කලිසමක් ඇඳගත් මුහුණ පුරා රැවුල වවාගත් කඩවසම් සිරුරක් ඇති අයෙකු වටා ඉව අල්ලමින් එම අය වටා ගමන් කළ බවත්, ඒ අනුව නිල සුනඛයා භාර පොලිස් නිලධාරියා වන පො.සැ. 31842 දිසානායක නිලධාරියා විසින් මෙම ඉව ලබා දුන් පුද්ගලයා සැකකරු බවට තමා දැනුවත් කළ බවත්, ඒ මත හා පුද්ගලික ඔත්තුකරුවෙකුගෙන් ලද තොරතුරු ද මත පැමිණිලිකරුට වරද කියා දී 2023.01.11 දින පැය 14.30ට අත්අඩංගුවට ගන්නා ලද බවත්, එම සැකකරු කපුරුනයිදේගේ තිළිණ මධුසංඛ (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) නම් වූ බවත් සටහන් යොදා ඇත.

එසේම, ඉහත කී පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතෙහි 2023.01.11 දින පැය 09.30ට පිටුව 30 ඡේදය 31 යටතේ සටහන් කරන ලද දිවා කාලයේ නිවසක් බිඳ රු. 74,000.00ක් වටිනා දේපල සොරකම් කිරීම සම්බන්ධ පැමිණිල්ලට අදාළව එකී අපරාධය සිදුවූ ස්ථානය විමර්ශනය කිරීම සඳහා විද්‍යාත්මක අපරාධ විමර්ශන අංශයේ (සෝකෝ) නිලධාරීන් පැමිණ ඇති බවටත්, ඔවුන් පැමිණ අපරාධ ස්ථානය පරීක්ෂා කොට විමර්ශනය කර ඇති බවටත් නිරීක්ෂණය වේ. ඒ අනුව අනුරාධපුරය කොට්ඨාස අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ තොරතුරු සටහන් පොතේ 2023.01.11 වන දින පැය 20.50ට පිටුව 392 සහ ඡේදය 281 යටතේ යොදා ඇති සටහන අනුව එකී නිලධාරීන් විසින් 2023.01.11 වන දින පැය 18.10 සිට පැය 19.15 දක්වා අදාළ ස්ථානය පරීක්ෂා කළ බවත්, සාක්ෂි කිසිවක් අනාවරණය කර ගැනීමට නොහැකි වූ බවත් සඳහන් කර ඇත.

තවද, මැදවච්චිය පොලිස් ස්ථානයේ ආර්.අයි.බී.හි 2023.01.12 දින පැය 07.10ට පිටුව 234 ඡේදය 178 යටතේ 'නිල සුනඛ සටහන් ඇලවීම' යටතේ නිල සුනඛ භාර නිලධාරියා වන පොලිස් සැරයන් 31842 දිසානායක යන අය විසින් විමර්ශන සටහන් අලවා ඇත. එම විමර්ශන සටහනෙහි පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානයෙන් ලද දුරකථන පණිවිඩයක් අනුව 2023.01.11 වන දින නිල සුනඛ ඩයිසර් හා උපකරණ රැගෙන අපරාධ ස්ථානයට පිටව යන බවත්, එදින පැය 13.20ට පිහිඹියගොල්ලෑව, කරනගොල්ලෑව පිහිටි කේ.සමන්ත දිසානායක යන අයගේ නිවස වෙත නිල සුනඛ ඩයිසර් සමඟ ගොස් නිල සුනඛ හට ඉව ලබාදීම සඳහා කහ පාට මිටියක් තෝරා ගෙන පැය 13.40ට නිල සුනඛ ඩයිසර් හට ඉව ලබාදුන් බවත්, නිල සුනඛ ඉව හොඳින් ලබාගෙන අපරාධ ස්ථානයෙන් පිටවී පාරට පැමිණ වමට හැරී කැදැව පිහිඹියගොල්ලෑව මාර්ගයේ කිලෝ මීටර් එකක් පමණ ගමන් කර වම් පැත්තේ ඉඩමට හැරී එම ඉඩමේ ඇති නිවසකට ගමන් කර නැවත පාරට ගොස් නැවත නිවස තුළට ගොස් නතර වූ බවත්, ඒ අනුව මෙම අපරාධය සම්බන්ධ සැකකරුවෙකු මෙම නිවසට පැමිණ ඇති

බවට නිගමනය කර පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් තිළිණ මධුසංඛ (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) යන අය අත්අඩංගුවට ගන්නා ලද බවත් සටහන් යොදා ඇත.

1 වන වගඋත්තරකරුගේ සටහන් අනුව අදාළ නිවසේ පුද්ගලයෙකු සිට ඇති බවටත්, එම පුද්ගලයා වටා නිල සුනඛයා ගමන් කළ බවටත් සඳහන් වේ. එහෙත් නිල සුනඛ අංශයේ පො.සැ. 31842 දිසානායක නිලධාරියාගේ සටහන් අනුව ඩයිසර් නිල සුනඛයා අදාළ නිවස තුලට ගොස් ඇති බවට සඳහන් වන නමුත්, මෙම සටහන් තුළ පුද්ගලයෙකු වටා ගොස් නතර වූ බවට සටහන් යොදා නොමැත. කෙසේ වෙතත් 1 වන වගඋත්තරකරුගේ නිරීක්ෂණ සටහන් සහ නිල සුනඛ අංශයේ පො. සැ. 31842 දිසානායක නිලධාරියා විසින් යොදා ඇති ඉහත කී සටහන් අනුව, ඩයිසර් නම් නිල සුනඛයා පැමිණිලිකරුගේ නිවසට ගොස් ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු කියා සිටින්නේ, නිවසක් බිඳ එහි භාණ්ඩ සොරා ගැනීමක් සම්බන්ධයෙන් කටඋත්තරයක් ගැනීමට යැයි සැකපිට පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානය වෙත ඔහුව රැගෙන ගිය බවයි. එමෙන්ම ඔහු වැඩිදුරටත් කියා සිටින්නේ, පොලිස් නිල සුනඛයා, එකී නිල සුනඛයා භාර නිලධාරියා හා අනෙකුත් පොලිස් නිලධාරීන් තම නිවසට පැමිණෙන විට තමා නිවසේ නොසිටි බවත්, තමා ගවයන් බැඳීම සඳහා ගොස් සිටි බවත්, තම පියා විසින් සිදු කළ දැනුම් දීම පරිදි තමා නිවසට පැමිණි බවත්, තමා එන විට නිල සුනඛයා අඹගහ යට දිගා වී සිටි බවත්, පොලිස් නිලධාරීන් තමාට කිසිවක් නොකියන ලද බවත්, කටඋත්තරයක් ගැනීමට බව පවසා පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය බවත් ය.

පැමිණිලිකරුගේ පියා වන වීරරත්න යන අය විසින් කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත්තේ ද පොලිස් නිලධාරීන් හා නිල සුනඛයා 2023.01.11 වන දින තම නිවසට පැමිණි බවත්, එවිට නිවසේ සිටියේ තමා පමණක් වන බවත්, පොලිස් නිලධාරීන් "පුතා කෝ?" කියා අසන ලද බවත්, "පුතා ගවයන් බඳින්න ගියා" කියා තමා පැවසූ බවත්, "පුතාට අඩගසන්න" කියා තමාට පැවසූ බවත්, එවිට පුතා පැමිණි බවත්, පුතා නිවසට එනවිට නිල සුනඛයා අඹගහ යට වැතිරී සිටි බවත්, පසුව කටඋත්තරයක් ගැනීමට යැයි පවසා පුතා පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය බවත් ය.

ඉහත සඳහන් පැමිණිලිකාර පාර්ශවය සහ වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණු අනුව මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානය වෙත ලැබී තිබූ පැමිණිල්ලකට අදාළව දිවා කාලයේ නිවසක් බිඳ දේපළ සොරකම් කිරීමේ වරද මත ය.

1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතෙහි 32(1)(ආ) වගන්තිය අනුව යම් සංඥෙය වරදකට සම්බන්ධ වූ තැනැත්තෙකු හෝ එසේ සම්බන්ධ වූ බවට යම් තැනැත්තෙකුට විරුද්ධව සාධාරණ පැමිණිල්ලක් ලැබී තිබේද නැතහොත් ඒ බවට යම් තැනැත්තෙකුට විරුද්ධව විශ්වාස කටයුතු තොරතුරක් ලැබී තිබේද නැතහොත් ඒ බවට යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් සාධාරණ

සැකයක් පවතීද එවැනි යම් තැනැත්තෙකු අත්අඩංගුවට ගැනීම කළ හැකිය යන්න සඳහන් වේ. එසේම, 1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතෙහි 2 වගන්තිය ප්‍රකාරව "සංඥෙය වරද" යන්න අර්ථ නිරූපණය කර ඇති අතර, එකී අර්ථ නිරූපණය අනුව, 1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතෙහි පළමුවන උපලේඛනයට අනුකූලව සාම නිලධරයෙකු විසින් වරද කරන්නා වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගැනීම සිදු කළ හැකි වරදක් "සංඥෙය වරදකි".

ඒ අනුව 1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතෙහි පළමුවන උපලේඛනය ප්‍රකාරව සොරකමකට සම්බන්ධ පුද්ගලයෙකු වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගත හැකි බව සඳහන්ව ඇති බැවින් එකී වරද "සංඥෙය වරදක්" ලෙස හඳුනාගත හැකි ය. එසේහෙයින් එකී වරදට අදාළව යම් තැනැත්තෙකු අත්අඩංගුවට ගනු ලබන්නේ නම් ඉහත කී 1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතෙහි 32(1)(ආ) වගන්තිය අනුව එකී වරදට සම්බන්ධ වූ බවට යම් තැනැත්තෙකුට විරුද්ධව සාධාරණ පැමිණිල්ලක් හෝ විශ්වාස කටයුතු තොරතුරක් ලැබී තිබිය යුතු අතර, එසේ නැතහොත් යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් සාධාරණ සැකයක් පැවතිය යුතු ය.

ඉහතින් සඳහන් කර ඇති පරිදි පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට පදනම් වූ පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානය වෙත ලැබී තිබූ සොරකමකට අදාළ පැමිණිල්ල පිළිබඳව සලකා බැලීමේ දී කොමිෂන් සභාව වෙත ගොනු කර ඇති මෙම පැමිණිල්ලෙහි පැමිණිලිකාර කේ.එන්.ටී.මධුසංඛ යන අය අදාළ අපරාධය සිදු කර ඇති බවට එකී පැමිණිල්ලෙහි සඳහන්ව නොමැති බැවින් පැමිණිලිකරුට එරෙහිව සාධාරණ පැමිණිල්ලක් පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානය වෙත ලැබී නොතිබූ බව නිරීක්ෂණය වේ. කෙසේවෙතත් එකී පැමිණිල්ලට අදාළ විමර්ශන කටයුතු සඳහා ඩයිසර් නම් නිල සුනඛයා යොදාගෙන ඇත. 1 වන වගඋත්තරකරුගේ නිරීක්ෂණ සටහන් සහ නිල සුනඛ අංශයේ පො. සැ. 31842 දිසානායක නිලධාරියා විසින් යොදා ඇති ඉහත කී සටහන් අනුව, ඩයිසර් නම් නිල සුනඛයා හට අපරාධය සිදු වූ ස්ථානයේ දී ලබා දුන් ඉව අනුව එකී නිල සුනඛයා පැමිණිලිකරුගේ නිවසට ගොස් නතර වී ඇති බව නිරීක්ෂණය වේ. එසේම, නිල සුනඛයා තම නිවසට පැමිණි බවට පැමිණිලිකරු විසින් ද ප්‍රකාශ කර ඇත. නිල සුනඛයින් යනු අපරාධ සිදු වූ ස්ථානයන්හිදී ලබාදෙන ඉව අනුව එම අපරාධයන්ට අදාළ අපරාධකරුවන් සිටින ස්ථාන සොයා යාමට විශේෂයෙන් පුහුණු කරන ලද සත්ව කණ්ඩායමකි. ඒ අනුව පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානය වෙත ලැබී තිබූ සොරකමකට අදාළ පැමිණිල්ලට අදාළ විමර්ශන සඳහා යොදවාගත් නිල සුනඛයා විසින් පැමිණිලිකරුගේ නිවසට ගොස් නතර වීම මගින් පැමිණිලිකරුට එරෙහිව විශ්වාස කටයුතු තොරතුරක් පොලිස් නිලධාරීන් වෙත ලැබී ඇති බව පෙනී යයි. එසේ හෙයින් පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානයේ 1 වන වගඋත්තරකරු ඇතුළු නිලධාරීන් විසින් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම නීතියෙන් නියම කර ඇති කාර්යපටිපාටිය අනුව සිදු කර ඇති බව නිරීක්ෂණය වේ.

තවද, පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් කියා සිටින්නේ, තමාව අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය පසුව 2 වන වගඋත්තරකාර ස්ථානාධිපති (හිටපු) එම්.සිසිරසේන යන

නිලධාරියා විසින් අදාළ සොරකම භාර ගන්නා ලෙසට පවසමින් ලී පොලුවලින් පහරදුන් බවත්, තමාගේ කකුල් අතපය ගැට ගසා පහරදුන් බවත්, තම කන්වලට හා බෙල්ල ප්‍රදේශයට ද පහරදුන් බවත්, සොරකම භාර නොගත් නිසා සපත්තුවෙන් ද බෙල්ල පාගන ලද බවත් ය.

පැමිණිලිකරුට සිදුවූ බව පවසන පහරදීම සම්බන්ධයෙන් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා 2023.01.12 වන දින ප.ව. 6.36ට පමණ අනුරාධපුර ශික්ෂණ රෝහලට ඇතුලත්ව ඇති බවටත්, ඔහුට 2023.01.12 දින අධිකරණයෙන් ඇප ලබාදුන් පසු රෝහල්ගතව ඇති බවටත් කරුණු නිරීක්ෂණය වේ.

එසේම, පැමිණිලිකරු වෙත නිකුත් කර ඇති අංක 129/23 සහ 2023.01.13 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාවේ පහත පරිදි පැමිණිලිකරුගේ ශරීරයේ තිබූ තුවාල සටහන් කර ඇත.

"External Injuries -

01. 0.5x0.5cm abrasion over posterior aspect of left lower arm.
02. 10x8cm contusion with underlying.
03. 10x8cm contusion with hematoma over left lower arm.
04. Bilateral ear drum perforation (More than 50%)"

එසේම, එකී තුවාල අතරින් අංක 01,02 සහ 03 යන තුවාල බරපතල නොවන තුවාල ලෙසත්, අංක 04 යටතේ දක්වා ඇති තුවාලය බරපතල තුවාලයක් ලෙසත්, එම සියලු තුවාල මොට ආයුධ වලින් සිදු වූ තුවාල වන බවත් අධිකරණ වෛද්‍යවරයා විසින් දක්වා තිබේ.

එමෙන්ම, අධිකරණ වෛද්‍ය වාර්තාවේ රෝගියා විසින් ලබාදෙන ලද කෙටි ඉතිහාසය යටතේ පහත පරිදි සටහන් කර ඇත.

"10 වෙනිදා දවල් කරනගොල්ලැව ගමේ ගෙදරකට හොරු පැනලා. ඒක හොයන්න පොලිස් බල්ලෙක් ගෙනාවා. පොලිස් බල්ලා අපේ වත්තට පැන්නා. මම ළඟට ආවේ නැහැ. අපේ ගෙදර ළඟ වාඩිවුණා. මේ හොරකමට මාව සැක කරලා කටඋත්තරයක් ගන්න පිහිඹියගොල්ලෑව පොලීසියට අරන් ගියා. (2023.01.11 වන දින ප.ව.1.00ට පමණ) අත්වලට මාංචු දාගෙන ගියා. අරගෙන ගිහින් කාමරයකට දාලා වැරැද්ද පිළිගන්න කීවා. මම පිළිගත්තේ නැහැ. මාව මූණින් අතට බිම නිදිකෙරෙව්වා. ඇඳුම් ගැලෙව්වේ නැහැ. ලී පොලුවලින් ඕ.අයි.සී. මහත්තයා කකුල් දෙකේම කෙණ්ඩවලටයි යටපතුල්වලටයි ගැහුවා. පිටට ගහද්දී අතින් ඇල්លුවා. වම් අතට පොලු පහරක් වැදුනා. අතින් කන් දෙකටම ගැහුවා. මම සිගරට්, අරක්කු විතරයි පාවිච්චි කරන්නේ. වෙන මත්ද්‍රව්‍ය පාවිච්චි කරන්නේ නැහැ. ගහලා මාව කූඩුවට දැම්මා. 12 වෙනිදා උදේ මැදවච්චිය උසාවියට දාලා ඇප දුන්නා."

මේ අනුව පැමිණිලිකරු කොමිෂන් සභාව වෙත මෙන්ම අධිකරණ වෛද්‍යවරයා වෙත ද ප්‍රකාශ කර ඇත්තේ තමා හට 2 වගඋත්තරකාර පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානයේ (හිටපු) ස්ථානාධිපතිවරයා විසින් පහරදීමක් සිදු කරන ලද බව ය.

මෙම පැමිණිල්ලට අදාළව 2024.06.05 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී 2 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරු විසින් පහරදීමක් සම්බන්ධයෙන් තමාට එරෙහිව කරනු ලබන චෝදනාව ප්‍රතික්ෂේප කරන බවයි. 2 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ, තමා පැමිණිලිකරුට පහරදීමක් සිදුකළේ නම් ඔහුව අධිකරණය වෙත ඉදිරිපත් කරන අවස්ථාවේදී ඒ බව අධිකරණය වෙත කියා සිටීමේ අයිතිය ඔහුට තිබූ බවත්, ඔහු එසේ කර නොමැති බවත් ය. එසේම, තමා පහරදුන්නේ නම් ඒ පිළිබඳව උසස් නිලධාරීන්ට පැමිණිලි කිරීමට හැකියාව තිබූ නමුත්, එසේද කර නොමැති බවත්, පැමිණිලිකරු සම්බන්ධයෙන් ලැබී ඇති අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් තුවාල සම්බන්ධයෙන් තමා හට වගකීමක් දැරිය නොහැකි බවත් ය.

පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානයේ දෛනික තොරතුරු සටහන් පොතේ 2023.01.12 වන දින පැය 08.30ට පිටුව 146 ඡේදය 753 යටතේ යොදා ඇති සටහන අනුව පැමිණිලිකරුව අත්අඩංගුවට ගත් දිනට පසුදින එනම්, 2023.01.12 වන දින පැය 08.30ට අධිකරණය වෙත රැගෙන ගොස් ඇති බව නිරීක්ෂණය වේ. එසේම, එදින මැදවච්චිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පැමිණිලිකරු වෙත ඇප ලැබී ඇති බවත්, පැමිණිලිකරු එදිනම එනම්, 2023.11.12 වන දින ප.ව. 06.36ට අනුරාධපුර ශික්ෂණ රෝහල වෙත ඇතුළත්ව ඇති බවත් ඉදිරිපත්ව ඇති ලේඛන අනුව පෙනී යයි.

පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සිදු කළ 1 වන වගඋත්තරකාර උ.පො.ප. නන්දසේන නිලධාරියා විසින් පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානයේ ග්‍රහන අපරාධ තොරතුරු සටහන් පොතෙහි 2023.01.11 වන දින පැය 19.15ට පිටුව 33 ඡේදය 34 යටතේ යොදා ඇති සටහනෙහි පැමිණිලිකරුගේ ශරීරයේ මතුපිටින් පෙනීමට තුවාල කිසිවක් නොමැති බවට සටහන් යොදා ඇත. එසේම, එකී සටහනට පහළින් පැය 20.00ට උපසේවක පො.කො. 95034 සමන්ත යන නිලධාරියා විසින් ද පැමිණිලිකරු පරීක්ෂා කළ බවටත්, ඔහුගේ ශරීරයේ පිටතින් පෙනීමට තුවාල කිසිවක් නොමැති බවටත් සටහන් යොදා ඇති බව නිරීක්ෂණය වේ.

එකී සටහන් අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කරන අවස්ථාවේදී ඔහුගේ ශරීරයේ කිසිදු තුවාලයක් තිබී නොමැති බව තහවුරු වේ. පැමිණිලිකරු අත්අඩංගුවට ගත් දිනට පසුදින එනම්, 2023.11.12 වන දින අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එදිනම ප.ව. 06.36ට අනුරාධපුර ශික්ෂණ රෝහල වෙත ඇතුළත්ව ඇත. ඒ අනුව පැමිණිලිකරු අධිකරණයෙන් ඇප ලැබීමෙන් අනතුරුව ඒවේලාවෙහිම රෝහල්ගත වූ බවට සිදු කර ඇති ප්‍රකාශය පිළිගත හැකි බව නිරීක්ෂණය වේ. එහිදී ඔහුව පරීක්ෂා කරනු ලැබූ අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් ඔහුගේ ශරීරයේ බරපතල තුවාලයක් ද අතුළුව තුවාල හතරක් ඇති බවට සඳහන් කර

ඇත. පැමිණිලිකරුව 2023.01.11 වන දින අත්අඩංගුවටගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන ඒමෙන් අනතුරුව පැය 20.00ට උපසේවක පො.කො. 95034 සමන්ත යන නිලධාරියා විසින් පරීක්ෂා කිරීමේ දී පැමිණිලිකරුගේ ශරීරයේ පිටතින් පෙනීමට තුවාල කිසිවක් නොමැති බවට සටහන් යොදා ඇති බැවින් ඉහත කී තුවාල එම අවස්ථාවේ දී තිබී නොමැති බව තහවුරු වේ. එසේම, පැමිණිලිකරු පොලිස් භාරයේ තබාගෙන සිට 2023.11.12 වන දින පොලිස් නිලධාරීන් විසින් අධිකරණයට රැගෙන යාමෙන් අනතුරුව එදිනම අනුරාධපුර ශික්ෂණ රෝහල වෙත ඇතුළත් වී ඇති බැවින් ඉහත කී තුවාල පොලිස් භාරයේ සිටියදී සිදුව ඇති බව තහවුරු වේ.

තවද, පැමිණිලිකරු වෙත නිකුත් කර ඇති අංක 129/23 සහ 2023.01.13 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාවේ 'රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසය' යටතේ "....ඕ.අයි.සී. මහත්තයා පිටට ගහද්දී අතින් ඇල්ලුවා. වම් අතට පොලු පහරක් වැදුනා. අතින් කන් දෙකටම ගැහුවා..." යනුවෙන් සඳහන් කර ඇත. එකී අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් තුවාල අතරින් අංක 1, 2 සහ 3 ලෙස දක්වා ඇති මොට ආයුධයකින් සිදුව ඇති වම් බාහුවේ ඇති සිරීම් තුවාලය සහ තැලීම් තුවාල දෙක, ඉහත කී රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසයේ සඳහන් "වම් අතට පොලු පහරක් වැදුනා" යන්න සමඟ සැසඳන බවත්, එකී තුවාල මොට ආයුධයක් වන පොලු පහර හේතුවෙන් සිදු වී ඇති බවත් නිගමනය කළ හැකි ය. එසේම, 4 වන තුවාලය ලෙස දක්වා ඇති මොට ආයුධයකින් සිදු වූ බරපතල ලෙස කන් දෙකෙහිම කන් බෙර 50%කට වඩා හානි වීම, ඉහත කී රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසයේ සඳහන් "අතින් කන් දෙකටම ගැහුවා" යන්න සමඟ සැසඳන බවත්, එම තුවාලය 2 වන වගඋත්තරකරු විසින් අතින් සිදු කළ පහරදීම හේතුවෙන් සිදු වී ඇති බවත් නිගමනය කළ හැකි ය.

ඒ අනුව පැමිණිලිකරුහට සිදුව ඇති තුවාල පොලිස් නිලධාරීන් භාරයේ සිටියදී 2 වන වගඋත්තරකරු විසින් සිදු කළ පහරදීම හේතුවෙන් සිදුව ඇති තහවුරු වේ.

**<u>නිගමනය</u>**

ඉහත දක්වන ලද සියලු කරුණු අනුව සලකා බැලීමේ දී පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානය වෙත ලැබී තිබූ සොරකමකට අදාළ පැමිණිල්ලක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සඳහා ඩයිසර් නම් නිල සුනඛයා යොදාගෙන ඇත. 1 වන වගඋත්තරකරුගේ නිරීක්ෂණ සටහන් සහ නිල සුනඛ අංශයේ පො. සැ. 31842 දිසානායක නිලධාරියා විසින් යොදා ඇති ඉහත කී සටහන් අනුව, ඩයිසර් නම් නිල සුනඛයා හට අපරාධය සිදු වූ ස්ථානයේ දී ලබා දුන් ඉව අනුව එකී නිල සුනඛයා පැමිණිලිකරුගේ නිවසට ගොස් ඇති බව නිරීක්ෂණය වේ. නිල සුනඛයා තම නිවසට පැමිණි බවට පැමිණිලිකරු විසින් ද ප්‍රකාශ කර ඇත. ඒ අනුව පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානය වෙත ලැබී තිබූ සොරකමකට අදාළ පැමිණිල්ල සම්බන්ධයෙන් පැමිණිලිකරුට එරෙහිව විශ්වාස කටයුතු තොරතුරක් පොලිස් නිලධාරීන් වෙත ලැබී ඇති බව පෙනී යයි. එසේ හෙයින් 1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතෙහි 32(1)(ආ) වගන්තිය අනුව සංඥෙය වරදක් වන සොරකමට අදාළව පැමිණිලිකරුට එරෙහිව විශ්වාස කටයුතු තොරතුරක් ලැබී තිබියදී ඔහුව අත්අඩංගුවට ගැනීමට වගඋත්තරකාර පාර්ශවය විසින් කටයුතු

කර ඇති බැවින් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම නීතියෙන් නියම කර ඇති කාර්යපටිපාටිය අනුව සිදු කර ඇති බව නිරීක්ෂණය වේ.

එසේවුවද ඉහත කී කරුණු අනුව පැමිණිලිකරු පොලිස් නිලධාරීන් භාරයේ සිටියදී වධහිංසනයට ලක්ව ඇති බව තහවුරු වේ. පැමිණිලිකරු හට අදාළ පහරදීම සිදු කරන ලද්දේ 2 වන වගඋත්තරකරු විසින් බවට පැමිණිලිකරු කොමිෂන් සභාව වෙත මෙන්ම අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත ද ප්‍රකාශ කර ඇත.

<u>අමල් සුදත් සිල්වා එ. පො.ප. කොඩිතුවක්කු</u> (1987) 2 Sri L.R. 119 නඩුවේ දී ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව ප්‍රකාරව කිසිම තැනැත්තෙකු වධහිංසාවලට කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවත්, එය කිසිදු සීමාවකට යටත් කර නොමැති මූලික අයිතිවාසිකමක් බවත්, යම් පුද්ගලයෙකු අපරාධකරුවෙකු වුවද මෙම මූලික අයිතිවාසිකම ඔහුට ද එලෙසින්ම අදාළ වන බවත් සඳහන් කර ඇත.

එසේහෙයින් 2 වන වගඋත්තරකාර පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානයේ හිටපු ස්ථානාධිපති එම්. සිසිරසේන නිලධාරියා විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති කිසිම තැනැත්තෙකු වධහිංසාවලට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

මෙම පැමිණිල්ලට අදාළව 2024.01.31 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී 1 වන වගඋත්තරකරු විසින් තමා හට පහරදීමක් සිදු නොකරන ලද බව පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත. එසේ හෙයින් 1 වන වගඋත්තරකරු හට පහරදීමට අදාළව වගකීමක් පැවරීමට කෙමිෂන් සභාව අදහස් නොකරයි.

**ඒ අනුව පහත නිර්දේශ ඉදිරිපත් කර සිටී.**

01. 2 වන වගඋත්තරකරු විසින් රුපියල් එක් ලක්ෂය (රු.100,000/-)ක මුදලක් පැමිණිලිකරු වෙත වන්දි වශයෙන් ගෙවිය යුතු ය.

02. 2 වන වගඋත්තරකරු මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2025. 12 . 17 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු සහ පොලිස්පතිවරයා වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

| | |
|---|---|
| එල්.ටී.බී.දෙහිදෙණිය,<br>ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)<br>සභාපති,<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. | නිමල් ජී. පුංචිහේවා,<br>ජ්‍යෙෂ්ඨ නීතිඥ,<br>කොමසාරිස්,<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. |
| විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය<br>ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)<br>සභාපති<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | නිමල් ජී. පුංචිහේවා<br>ජ්‍යෙෂ්ඨ නීතිඥ<br>කොමසාරිස්<br>... මානව හිමිකම් කොමිෂන් සභාව |

පිටපත් :- 01. අමාත්‍යතුමා - කරුණු දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති - අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා
ශ්‍රී ලංකා පොලීසිය

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.